**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.06.09 පැය 2200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1174/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොසොන් උත්සවයට සමගාමීව අනුරාධපුර නගරය මූලික කරගෙන විශේෂ රථවාහන මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

2025 ජුනි මස 10 වන දිනට යෙදී ඇති පොසොන් පුන් පොහොය දින රාජ්‍ය පොසොන් උත්සවය පැවැත්වෙන අනුරාධපුර නගරයට දිවයිනේ නන් දෙසින් විශාල සැදැහැවතුන් පිරිසක් සහ ඊට සමගාමීව විශාල රථවාහන හා යතුරුපැදි ප්‍රමාණයක් පැමිණෙතැයි අපේක්ෂා කෙරේ.

මෙලෙස පැමිණෙන සැදැහැවතුන්ට හා මහජනතාවට පීඩාවක් සිදුවන ආකාරයේ අධික ශබ්ද සහිත සයිලන්සර්, නලා සවිකරන ලද යතුරු පැදි සහ රථ වාහන , අධිබලැති එංජින් ධාරිතාවකින් යුතු යතුරු පැදි අත්අඩංගුවට ගැනීම සඳහා අනුරාධපුර නගරය කේන්ද්‍ර කරගනිමින් විශේෂ රථවාහන මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. ඒ සඳහා විශේෂ රථවාහන කණ්ඩායම් අනුරාධපුර නගරය ආවරණය වන පරිදි යොදවා ඇත.

එබැවින් අනුරාධපුර නගරයට පැමිණීමේදී සැදැහැවතුන්ට හා මහජනතාවට පීඩාවක් සිදුවන ආකාරයේ රථ වාහන සහ යතුරු පැදි භාවිතා නොකරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**